# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2022.09.13

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : **ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)**

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය**

01) පී.සෝමසිරි මහතා - ආණ්ඩුකාර ලේකම්

02) යූ.බී.ආර්.රාජපක්ෂ මහතා - සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප)

03) ඒ.ඩී.එස්.සදීකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)

04) සිරිසෝම ලොකුවිතාන මහතා - ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප)

05) කේ.චම්පා එන්. පෙරේරා මිය - ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප)

06) ගාමිණී ධර්මසේන මහතා - ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප)

07) චන්දන රණවීර ආරච්චි මහතා - ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප)

08) ඩබ්ලිව්.එම්.දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

09) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

10) ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

11) කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

12) ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - වැ.බ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

13) කණිෂ්ක ශ්‍රී ලාල් මහතා - ජ්‍යෙ.ස.ලේකම්.පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ,

14) පාලිත අබේවර්ධන මහතා - ප්‍රධාන නීති නිලධාරී

15) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

16) පේෂලා අබේසූරිය මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

17) එස්.එම්.පී.එම්.විපුලසේන මිය - සහකාර ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)

18) ආර්.එම්.ඩී.පී.කුමාරි මිය - සහකාර ලේකම්, ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත් සභාව සඳහා ඉන්ධන ලබා ගැනීම සඳහා පාරිභෝගික ඒකක (Consumer point) දෙකක් ලබා ගැනීම සම්බන්ධව | පළාත් සභාවේ වාහන සඳහා ඉන්ධන සපයා ගැනීමේ ගැටළුවට පිළියමක් වශයෙන් පළාත් සභාව වෙනුවෙන් ඉන්ධන ලබා ගැනීමට පාරිභෝගික ඒකක (Consumer point) දෙකක් ලබා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යාමේදී පැන නැගුණු ගැටළු සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)විසින් කරුණු පැහැදිලි කරන ලදී.<br>ඒ අනුව එය ලබා ගැනීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග පිළිබඳ සොයා බලා කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දෙන ලදී.<br>තවද අත්‍යාවශ්‍ය රාජකාරීවල නිරතවන රජයේ වාහන සඳහා රජය විසින් ලබා දෙන ඉන්ධන ලීටර් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් රජයේ වාහන සඳහා OR කේත ලබා දීමට අදාළ පොදු කේත අංකයක් (BRN) ලබා දීම සම්බන්ධයෙන් වූ සාකච්ඡාවේදී ඉන්ධන ප්‍රමාණය වැඩිකර දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත් ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැති බවත් පෙන්වා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | කෘෂිකර්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ගෙවතු වගා තරඟාවලිය පැවැත්වීම සම්බන්ධව | කෘෂිකර්ම කටයුතු කෙරෙහි මහජනතාව දිරිගැන්වීම පිණිස සංවිධානය කරන ලද බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන අතර පැවැත්වෙන ගෙවතු වගා තරඟාවලිය සඳහා ඉදිරිපත් කර ඇති ආයතන ලයිස්තුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කර ඇති බවත්, තරඟයේ අවසාන ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා මුදල් සපයා ගැනීමට රුපියල් ලක්ෂ පහක (රු. මිලියන දශම පහක) ඇස්තමේන්තුවක් අනුමතකර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බවත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>තවද වගා කටයුතු ප්‍රවර්ධනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්කයට ලක්ෂ 1 බැගින් පළාත තුල ගෙවතු ලක්ෂ 3ක් වගා කටයුතු සඳහා යොදා ගැනීමේ කෘෂි ප්‍රවර්ධන වැඩපිළිවෙල සම්බන්ධයෙන් ප්‍රගතිය මෙතෙක් ඉදිරිපත්කර නොමැති බවත් එය ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.තවද පාසැල් ගෙවතු වගා තරඟාවලියට අදාළ කටයුතු සම්බන්ධයෙන් මේ වන විට පාසැල් ගෙවතු තේරීමේ විනිශ්චය කටයුතු සිදු කරමින් පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කළ අතර ඊට අදාළ තොරතුරු තමා වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br>තවද එම විනිශ්චය මණ්ඩලය සඳහා පත්කර ඇති නිලධාරීන්ගේ දුරකථන අංක ලබාගෙන ඔවුන් සම්බන්ධ කරගෙන එම ගෙවතු වගාවන් සම්බන්ධව අධ්‍යයනයක් කිරීම සඳහා යාමට කටයුතු සංවිධානය කරන ලෙස සැලසුම් අංශයට දන්වා ඇති බවත් ඒ සඳහා කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | ලේකම්, කෘෂි කර්ම/ අධ්‍යාපන අමාත්‍යාංශය<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 03 | කාර්යාල කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව | මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සකස් කිරීමේ කටයුතු ඇණහිට ඇති බවත් අදාළ ආයතනයට server පහසුකම් ලබා ගැනීමේ අවශ්‍යතාවයත් පැන නැගී ඇති අතර එය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිත ආයතනය මඟින් සපයා ගැනීමට හැකි බවත් ඒ සම්බන්ධයෙන් අද දින (2022.09.13) අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡාවක් පැවැත්වෙන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව නැවත වරක් server ලබා ගැනීම සඳහා අමතර වියදමක් සිදු නොකර එම ආයතනයෙන් එය ලබා ගැනීම සුදුසු බවටත් , පැවැත්වෙන සාකච්ඡාවෙන් අනතුරුව මේ සඳහා තීරණයක් ගැනීම සුදුසු බවත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 04 | "We green" වෙළඳ සැල කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ සුහ සාධක සංගමය වෙතම ලබා දෙන ලෙස ඉල්ලීම සම්බන්ධව | "We green" වෙළඳ සැලේ පවතින අඩුපාඩු මත එම වෙළඳ සැල පවත්වාගෙන යාමේ කටයුතු කෘෂි සේවා අධිකාරියට පැවරීමට කටයුතු කරන ලෙස දැන්වීමෙන් අනතුරුව නැවත එය කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ සුහ සාධන සංගමයටම පවත්වාගෙන යාමට අවසර ලබාදෙන ලෙස කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සමඟ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවද , එමෙන්ම ආයුර්වේද සංස්ථාව මඟින් පවත්වාගෙන ගිය අළෙවි කුටිය මේ වන විට ක්‍රියාත්මක නොවන බැවින් එම ඉඩකඩ කොටසද සමඟ "We green"වෙළඳසැල පුළුල්කර ඵලදායී වන පරිදි අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යද මිලදී ගත හැකි ආකාරයෙන් වෙළඳ සැලක් පවත්වාගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන්ද නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු හා යෝජනා ඉදිරිපත් කරන ලදී. | ලේකම්, කෘෂි කර්ම අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය නව ගොඩනැගිල්ලට ස්ථානගත කිරීම සම්බන්ධව | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපතිගේ කාමරය හදිසි පිවිසුම් දොරටුව අවහිර වන සේ පිහිටා ඇති බැවින් හා කරදියාන ප්‍රදේශයේ නව ගොඩනැගිල්ල ඉදිකර අවසන්ව ඇති බැවින් එම ආයතනය එහි ස්ථානගත කරන ලෙස දන්වා ඇති නමුත් ඔවුන් ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කර ඇති බව සාකච්ඡා කරන ලදී.<br><br>ඒ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා සමඟ පැවති සාකච්ඡාවට අනුව ඔවුන් මෙම ගොඩනැගිල්ලෙන් බැහැර වීමෙන් අනතුරුවද ඔවුන්ට පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම සඳහා කාමරයක් ලබා දීමට සාකච්ඡා කර ඇති බවට ආණ්ඩුකාර ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 06 | වායු සමීකරණ ඒකකයේ කටයුතු සඳහා ක්‍රියාකරුවෙකු යොදවා ගැනීම සම්බන්ධව | බස්නාහිර පළාත් ගොඩනැගිල්ලේ පිහිටා ඇති වායු සමීකරණ පද්ධතිය සඳහා ස්ථිර ක්‍රියාකරුවෙකු යොදවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>දැනට ඒ සඳහා පුහුණු සේවකයෙකු යොදවා ඇති නමුත් ඒ සඳහා සේවකයන් දෙදෙනෙකු සිටිය යුතු බවට කරුණු සාකච්ඡා කල අතර සුදුසු සේවකයෙකු වෙස්ප්‍රෝ ආයතනයෙන් හෝ ලබාගෙන ඒ සඳහා පුහුණුවක් ලබා දී එම කටයුතු යථාවත් පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 07 | සෞඛ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට විධිමත් පරිදි පත්වීම් ලිපි ලබා දීම සම්බන්ධව | රේඛීය අමාත්‍යාංශයෙන් පත්වීම් ලබා දී පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එම තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පසු ඉදිරි කටයුතු සඳහා එම තොරතුරු පිරිස් පුහුණු අංශය වෙත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබයි. ඉන්පසු ඒ සම්බන්ධව අදාළ නිලධාරීන් වෙත දන්වා වැඩ භාරගත් බවට ලිපි ලබා දීමෙන් පසු නැවත එම තොරතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු පත්වීම් ලිපි සකස්කර අදාළ නිලධාරීන් වෙත එම ලිපි ඉදිරිපත් කිරීම සිදු කරනු ලබන බවත් , එම ක්‍රියාදාමය සිදු කිරීමේදී පත්වීම් ලිපි ලබා දීම ප්‍රමාද වන බැවින් රේඛීය අමාත්‍යාංශයෙන් නාම ලේඛනය ඉදිරිපත් කල අවස්ථාවේදී එම නිලධාරීන් සඳහා පත්වීම් ලිපි සකස්කර ඒවා ලබා දීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සඳහා එම තොරතුරු පිරිස් පුහුණු අංශය වෙත ඉදිරිපත් කිරීම තුළින් විධිමත් පරිදි එම ක්‍රියාදාමය සිදු කලහැකි බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.<br><br>විධිමත් පරිදි සෞඛ්‍ය සේවයේ නියුතු නිලධාරීන් වෙත පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුව කටයුතු කිරීම සුදුසු වන බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 08 | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වීමට කේන්ද්‍රීය පුද්ගලයෙකු නම් කිරීම සඳහා ඉල්ලීම සම්බන්ධව | තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වීමට සියලු අමාත්‍යාංශවල සහ සභාවල කේන්ද්‍රීය පුද්ගලයෙකු නම් කිරීම සඳහා එවා ඇති ලිපියට අනුව ප්‍රධාන ලේකම් කාර්යාලයේ නම් කල නිලධාරීන් සඳහාද පත්වීම් සංශෝධනය කළද පෙර පරිදිම යළි නම් කිරීම කල යුතු බව තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින් දැනුම් දෙන ලද බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>මෙහිදී මින් පෙර පත්කරන ලද නිලධාරීන් නම් කල නිලධාරී නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) ඩබ්ලිව්.එම්.දයාවතී මහත්මිය ,තොරතුරු නිලධාරී සහය තොරතුරු නිලධාරීන් පෙර පරිදිම පත් කිරීමටත්, කේන්ද්‍රීය නිලධාරී ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මහත්මිය පත්කරන ලෙසද ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 09 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාල පිරිසැකසුම් සකස් කිරීම සම්බන්ධව | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාලය අබලන් තත්වයේ පවතින බැවින් කාර්යාල පිරිසැකසුම් සකස් කිරීම සම්බන්ධව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් සමූපකාර අමාත්‍යාංශ ලේකම් මඟින් ලිපියක් ඉදිරිපත් කර ඇත.<br><br>ඒ පිළිබඳ සාකච්ඡා කිරීමේදී නව ඉල්ලීම් හා නවීකරණ කටයුතු නතර කරන ලෙස චක්‍රලේඛයක් නිකුත් කර ඇති අවස්ථාවක කාර්යාල පිරිසැකසුම් සඳහා අනුමැතිය ලබාදිය නොහැකි බවට ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>එම කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල ඉතා පැරණි ගොඩනැගිල්ලක් බවත් , එහි කොටසක් දැඩි ලෙස අබලන් වී ඇති බවත්ටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එම ගොඩනැගිල්ල පිරිසැකසුම සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා ස්ථානීය පරීක්ෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද එම ගොඩනැගිල්ල සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පැවති ගොඩනැගිල්ලක් බවටත් , එමෙන්ම වර්තමානයේ ඒ සඳහා මහජන බැංකුව වෙත මාසික කුළී මුදලක් ගෙවන බවටත් විවිධ කරුණු ඉදිරිපත් වූ බැවින් එසේ වීමට හේතු වූ කරුණු පිළිබඳ සොයා බලා වාර්තා කරන ලෙසට අමාත්‍යාංශ ලේකම් වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දෙන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 10 | බස්නාහිර පළාතේ ධීවර සංවර්ධන කටයුතු විෂය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වට පැවරීම සම්බන්ධව | ධීවර සංවර්ධන කටයුතු පිළිබඳ විෂය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු විෂයක් ලෙසට එක් කිරීමෙන් පසු දෙපාර්තමේන්තු නිල නාමය ද " සත්ව නිෂ්පාදන, ධීවර හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව" ලෙස වෙනස් කිරීම සඳහා එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත.<br><br>ඒ අනුව දෙපාර්තමේන්තු නිල නාමයන් ප්‍රකාශයට පත් කිරීමේ දී එය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර ඇති අතර නව විෂයන් එක් කිරීමෙන් පසුව නැවත දෙපාර්තමේන්තු නාමයන් වෙනස් කිරීම සඳහාද ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත්කල යුතු බවට ප්‍රධාන නීති නිලධාරි විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>එමෙන්ම අමාත්‍යාංශ පහ සඳහා ගලපා ඇති විෂයන් එම අමාත්‍යාංශ වලට අයත් විෂයන්ද යන්න පිළිබඳ සොයා බලා අමාත්‍යාංශ වලට විෂයන් ගලපා පෙළගස්වන ලෙස ගරු ආණ්ඩුකාරතුමා විසින් උපදෙස් ලබා දී ඇති බැවින් එසේ පෙළ ගැන්වීමෙන් අනතුරුව එසේ වෙනස්වන සියළුම ආයතනවල නාමයන් සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් ප්‍රධාන නීති නිලධාරි වෙත උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>ප්‍රධාන නීති නිලධාරි |

| | | | |
|---|---|---|---|
| 11 | බස්නාහිර පළාතේ වසර 10ක කාලයක් ඇතුලත නීතිපති දෙපාර්තමේන්තු වට ගෙවීමට ඇති හිඟ බිල්පත් පිළිබඳ | බස්නාහිර පළාත් සභාව 2010 සිට 2020 දක්වා නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති හිඟ බිල්පත් සම්බන්ධයෙන් නිරන්තරයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ලිපි ඉදිරිපත් කරන බවත් ඒ සඳහා ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා හිඟ බිල්පත් සාරාංශයක් ප්‍රධාන නීති නිලධාරී විසින් ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව රු.960550.00 ක වැඩිම හිඟ බිල්පත් ගෙවීමට ඇති ආයතනය වන අතර ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය රු.267250.00, සමූපකාර දෙපාර්තමේන්තුව රු.61300,පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය රු.29500.00 ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව රු.51000.00ක් හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ගැටළු සහිත බිල්පත් රු.183500 ආදි ලෙස රු.1553100.00 ක මුදලක් මේවන විට නීතිපති දෙපාර්තමේන්තුව වෙත හිඟ බිල්පත් ගෙවීමට ඇති බව ප්‍රධාන නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව වැඩිම හිඟ බිල්පත් ප්‍රමාණයක් ගෙවීමට ඇති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ඒ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා අත්තනෝමතික ලෙස ක්‍රියා කරන බවට වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.<br><br>ඒ අනුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කිසිදු නීති කටයුත්තක් සඳහා මින් ඉදිරියේදී පළාත් සභාවෙන් කිසිදු අවස්ථාවක නීති සහය ලබා නොදෙන බවත් සති දෙකක් ඇතුලත හිඟ බිල්පත් ගෙවා අවසන් කර තහවුරුවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් එසේ නැතහොත් නීති කටයුතු සඳහා පෞද්ගලිකව මුදල් ගෙවා නීති කටයුතු සිදුකර ගැනීමට සිදුවන බවත් තම ආයතන ප්‍රධානියාට දන්වන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වරයාට හා එම ආයතනයෙන් හිඟ බිල්පත් ගෙවීම සම්බන්ධ සාකච්ඡා කිරීමට පැමිණ සිටි නිලධාරියාට ප්‍රධාන ලේකම් විසින් තරයේ දන්වා සිටින ලදී. එමෙන්ම හිඟ බිල්පත් ගෙවීමට ඇති අනිකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවන්හි අවශ්‍ය සම්බන්ධීකරණය කර ගනිමින් හිඟ බිල්පත් ගෙවීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | ලේකම්, සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන, අමාත්‍යාංශ.<br><br>ප්‍රධාන නීති නිලධාරී |

| | | | |
|---|---|---|---|
| 12 | වියදම් කළමනාකරණය කිරීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ වලට පරිබාහිරව කටයුතු කිරීම සම්බන්ධව | රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා රජය විසින් නිකුත් කර ඇති විධි විධාන වලට අනුව මේ වන විට බස්පාහිර පළාත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතනවල සියලුම සැපයුම් මිලදී ගැනීම් හා ඉදිකිරීම් සම්පූර්ණයෙන් නවතා දමා ඇත.<br>එමෙන්ම විදුලිය, ජලය අරපිරිමැස්මෙන් පරිහරණය කරන ලෙසත් එසේ සැලකිල්ලක් නොදක්වන ආයතන දක්නට ලැබෙන බැවින් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ඒ පිළිබඳ අවධානය යොමුකරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>තවද ඊට කරුණු දක්වමින් ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වෙන පළාත් ක්‍රීඩා උත්සව සඳහා දින වෙන්කර පැවැත්වෙන ස්ථාන පිළිබඳව දැනුම් දී ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව රාජ්‍ය වියදම් සීමා කරන ලෙස දන්වා ඇති බැවින් ජාතික මහා ක්‍රීඩා උළෙල පැවැත්වීම පිළිබඳ තහවුරුවක් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>තවද රාජ්‍ය වියදම් කළමනාරණ චක්‍රලේඛවලට පටහැනි නොවන පරිදි මෙතෙක් පවත්වාගෙන ආ අත්‍යවශ්‍යම සුභසාධක කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 13 | ආයතනික කළමනාකරණය සම්බන්ධව | අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් සිදුකරන අධීක්ෂණය හා මෙහෙයවීමේ ක්‍රියාවලිය ශක්තිමත් ලෙස කළයුතු බවටත් සමහර ආයතන අමාත්‍යාංශ ලේකම්ගේ අධීක්ෂණයෙන් ගිලිහී යන බවක් දක්නට ලැබෙන බවටත් ප්‍රධාන ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව එක් එක් දෙපාර්තමේන්තු හා ආයතනවල කටයුතු සම්බන්ධයෙන් ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම ශක්තිමත්ව සිදුකල යුතුය. ඒ අනුව එක් එක් අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් කාර්යාලයට ගෙන්වා දැනට සිදුකරන කටයුතු මොනවාද, අඩුපාඩු තිබේද, කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා යෝජනා තිබේද යන්න සාකච්ඡා කිරීමට කටයුතු කළ යුතු බවට ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>තවද එම ආයතනවල අමාත්‍යාංශ හා ප්‍රධාන ලේකම් කාර්යාලයේ කිසිදු දැනුවත් වීමක් නොමැතිව නිලධාරීන්ගේ ස්ථාන මාරු සිදුවන බවට කරුණු ඉදිරිපත් කරමින්, ප්‍රධාන ලේකම් කාර්යාලයේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිඳු ස්ථාන මාරුවක්, මුදා හැරීමක් සිදු නොකරන ලෙස ලිඛිතව ආයතන දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 14 | විශ්‍රාම වැටුප් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම සම්බන්ධව | විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව අවුරුදු 60 ලෙස අඩු කිරීමත් සමඟ වයස සම්පූර්ණ වූ නිලධාරීන් විශ්‍රාම වැටුප් ඉල්ලුම්පත් ලබා දීමට ඒ පිළිබඳ විමසීම් සිදුකරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ගැටළුවක් ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව මේ වන විටත් විශ්‍රාම ගැන්වීම සම්බන්ධ චක්‍රලේඛය නිකුත් කර නොමැති බැවින් ඒ පිළිබඳ කටයුතු කිරීම සඳහා චක්‍රලේඛය නිකුත් කිරීමෙන් අනතුරුව සලකා බලන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 15 | අධ්‍යාපන අමාත්‍යාංශයේ පවතින කණිෂ්ඨ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමේ ගැටළුව සම්බන්ධව | අධ්‍යාපන අමාත්‍යාංශයේ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පවතින බවත්, මේ වන විට නව බඳවා ගැනීම් සිදු නොකරන බැවින් අළුත් සේවකයන් බඳවා ගැනීමට නොහැකි අතර, බහුකාර්ය ව්‍යාපෘතිය යටතේ බඳවාගත් සේවකයන්ගෙන්ද එම පුරප්පාඩු පුරවාගැනීමට හැකියාවක් නොමැති වූ බවත්, අමාත්‍යාංශ ලේකම් විසින් තම ගැටළුව ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව මේ වන විට බහුකාර්ය ව්‍යාපෘතිය යටතේ බඳවා ගැනීම සඳහා සේවකයන් නොමැති බවත්, දැනට එම ගැටළුව විසඳා ගැනීමේ හැකියාවක් නොමැති බව ප්‍රධාන ලේකම් විසින් කරුණු පැහැදිලි කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |
| 16 | මානව සම්පත් කළමනාකරණ පද්ධති අභ්‍යන්තර කමිටු සාමාජිකයෙකු නම් කිරීම සම්බන්ධව | මානව සම්පත් කළමනාකරණ පද්ධතියේ කටයුතු මෙහෙයවීම සඳහා පත්කරගෙන ඇති අභ්‍යන්තර කමිටුවේ ප්‍රධාන ලේකම්තුමියගේ සහයට හිටපු කෘෂිකර්ම අමාත්‍යාංශය ලේකම් කමිටු සාමාජිකයෙකු ලෙස පත්කර සිටි නමුත් මේවන විට ඔහු සේවයේ නොමැති බැවින් ඒ සඳහා විෂය දැනුම ඇති නිලධාරියෙකු පත්කර ගැනීමේ අවශ්‍යතාවක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව මේ පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් දැනුමක් ඇති නිලධාරියෙකු මේ සඳහා යොදවා ගත යුතු බැවින්, තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරියේ ප්‍රධානී ජගත් ප්‍රියන්ත මහතා පත් කර ගැනීමට ප්‍රධාන ලේකම් විසින් යෝජනා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 17 | පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා සංවර්ධන නිලධාරීන්ට ගුරු පත්වීම් ලබා දීම සම්බන්ධව | පත්වීම් ලබා දී ඇති සංවර්ධන නිලධාරීන්ට ගුරු පත්වීම් ලබා දී ගුරු පුරප්පාඩු පිරවීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වූ මුත් ක්‍රියාත්මක නොවූ බැවින් ගුරු පුරප්පාඩු පිරවීමට හැකියාවක් නොමැති වී ඇති බවට අධ්‍යාපන ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>මෙම පුරප්පාඩු පුරවා ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන් යොදවා ගැනීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවෙන් යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 18 | වෙන් කළ ප්‍රතිපාදන වැය කිරීම සම්බන්ධව | ➢ ගුරුවරුන්ගේ හිඟ වැටුප් ගෙවීම සඳහා රු.මිලියන429 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එම මුදල් ගෙවීමට කටයුතු කලයුතුව ඇත.නැතහොත් ලබන වසරේදී නැවත වරක් එම මුදල් වෙන්කරගත නොහැකි බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව එම මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>➢ තවද පළාත් සභා නඩත්තු කටයුතු සඳහා වෙන්කර ඇති රු.මිලියන 1553 ක මුදල නඩත්තු කටයුතු සඳහා යෙදවීමට ඉතිරිව ඇති බවද නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව මෙම ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් අමාත්‍යාංශ වලට වෙන්කර ඇති බවත්, එය ලබාගෙන කඩිනමින් අදාල නඩත්තු කටයුතු සිදු කරන ලෙස ලිඛිතව ලේකම්වරුන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>➢ තවද සෞඛ්‍ය අංශ සංවර්ධන වැය සඳහා රු. මිලියන 550 ක මුදලක් වෙන්කර ඇති අතර මේ වන විටත් වැය කර ඇති ප්‍රමාණය රු.මිලියන 70 ක් පමණක් වන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br>එම මුදල් ප්‍රමාණය සෞඛ්‍ය අංශයේ සංවර්ධන කටයුතු සඳහා කඩිනමින් යොදවා ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කරන ලෙස භාණ්ඩාගාරයට පිටපතක් සහිතව සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙත ලිඛිතව දන්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>➢ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති සඳහා මිලියන 330 ක් වෙන්කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව මෙම මුදල් පාසැල් දරුවන්ගේ සංවර්ධන කටයුතු සඳහා යොමු කිරීම කෙරෙහි ප්‍රගතිය පරීක්ෂා කළයුතු බව සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)<br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 19 | පරිගණක අළුත් වැඩියා කර ඉවත් කරවන කොටස් මූල්‍ය අංශයේ ගබඩාවට යොමු කිරීම සම්බන්ධව | තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මඟින් පරිගණක අළුත් වැඩියා කිරීමේදී එම පරිගණක වලින් ඉවත් කරන කොටස් මූල්‍ය අංශයේ ගබඩාවට යොමු කරන අතර, එම යොමු කරන කොටස් සත්‍ය වශයෙන්ම එම පරිගණක වල කොටස්ද යන වග පිළිබඳ සහතිකයක් ලබා දිය නොහැකි බවට නි.ප්‍ර.ලේ.(මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව එම ඉවත් කරන කොටස් ගබඩාව වෙත යොමු කිරීම අවශ්‍ය නොවන බවට තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

| | | | |
|---|---|---|---|
| 20 | වැසිකිලි පද්ධතිවල පවතින අඩුපාඩු සම්බන්ධව | පළාත් සභා ගොඩනැගිල්ල තුළ එක් එක් මහල් සඳහා සකස් කර ඇති වැසිකිලි භාවිතයේදී විවිධ අඩුපාඩු දක්නට ලැබුණු බවත්, ඒ පිළිබඳ මූලස්ථාන ඉංජිනේරු වෙත දැනුම් දීමෙන් අනතුරුව ඒවා පිළිසකර කිරීම සඳහා අඩුපාඩු හඳුනා ගැනීමට පවතින අඩුපාඩු සඳහන් කිරීම සඳහා ආකෘති පත්‍රයක් ලබා දුන් බවත් ඒ අනුව වැසිකිළිවල පවතින අඩුපාඩු නිතිපතා පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය) විසින් සඳහන් කරන ලදී.<br><br>ඒ අනුව සියළුම වැසිකිළි පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා දෙන ලෙස මූලස්ථාන ඉංජිනේරු ලිඛිතව දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 21 | නිලධාරීන් සඳහා පුවත්පත් මිලදී ගැනීම සඳහා | නිලධාරීන් සඳහා පුවත්පත් ලබා දීමේදී මෙතෙක් කල් ඇතැම් නිලධාරීන් පුද්ගලිකව පුවත්පත් මිලදී ගෙන බිල්පත ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කළ බවත්, පළාත් මූල්‍ය රීති අනුව එසේ සිදු කිරීමට නොහැකි බවත්, ආයතනය මගින් කාර්යාලයට හා නිලධාරීන් සඳහා අවශ්‍ය පුවත්පත් මිලදී ගෙන එය අදාළ නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස මූල්‍ය අංශය දන්වා ඇති බවත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්.(පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව ඉදිරියේදී නිලධාරීන් සඳහා පුවත්පත් ලබා දීමේදී අවශ්‍ය පුවත්පත් කාර්යාලය මගින් මිලදී ගෙන ඔවුන්ට ලබා දීමට කටයුතු කිරීම වඩාත් සුදුසු බවට ප්‍රධාන ලේකම් උපදෙස් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 22 | සති අන්ත නිවාඩු දින රාජකාරි සිදු කිරීම සම්බන්ධව | ඇතැම් ආයතනවල රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා නිලධාරීන්ට සති අන්තයේ රාජකාරි කිරීමේ අවශ්‍යතාවයක් ඉදිරිපත් කරන බවත් එසේ ලබා දීමට ඇති හැකියාව සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) විසින් විමසා සිටින ලදී,<br><br>චක්‍රලේඛ මගින් රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සඳහා සති අන්ත නිවාඩු දිනයන්හි අතිකාල සේවයේ යෙදීම සිදු නොකරන ලෙස දැනුම් දී ඇති බැවින්, සති අන්ත නිවාඩු දිනවල අත්‍යවශ්‍යම කාරණයක් හැරුණු විට රාජකාරි ඉටු නොකරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 23 | රාජ්‍ය වියදම් චක්‍රලේඛය පළාත් පාලන ආයතන සඳහා අදාළ කර ගැනීම සම්බන්ධව | රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛය බස්නාහිර පළාතට අදාළ කරගත් බව අමාත්‍යාංශවලට දැනුම් දීමෙන් පසු පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එම චක්‍රලේඛය පළාත් පාලන ආයතනවලටද අදාළ බව දන්වා පළාත් පාලන ආයතන වෙත යොමු කර ඇත. පළාත් පාලන ආයතන මේ වසරේ වරිපනම් ආදායම් ලැබීම් වලට අනුව ලබන වසර සඳහා අයවැය ලේඛන සකස් කරනු ලබයි. ඒ අනුව එම චක්‍රලේඛය එලෙසින්ම පළාත් පාලන ආයතනවලටද ගැළපීමේදී ගැටළුවක් මතුවී ඇති බව ප්‍රධාන නීති නිලධාරි විසින් පෙන්වා දෙන ලදී.<br><br>මෙම ආයතනවලින් මහජන අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුතු බැවින් සැලසුම් කරන ලද වැඩකටයුතු ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව එම ආයතන තම බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය සැලසීම මූලික අරමුණක් ලෙස ගෙන ක්‍රියාත්මක විය යුතු බැවින් පළාත් පාලන ආයතන සඳහා එය අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩල වලට අදාළ වන පරිදි අදාළ කරගත නොහැකි බවට සාකච්ඡා කරන ලදී. තවද ඒ පිළිබඳ පලාත් පාලන කොමසාරිස් දැනුවත් කරන ලෙසද ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 24 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන පළාත් සභාවේ නිලධාරින් සේවයට වාර්තා කිරීම සම්බන්ධව | වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්‍රීඩා නිලධාරි මාස තුනක කාලයක් රාජකාරි සඳහා වාර්තා නොකර වැටුප් ලබාගෙන ඇති බව වාර්තා වී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් කාර්යාලවල පළාත් සභාවට අනුයුක්තව පළාත් සභාව මඟින් වැටුප් ලබන සේවකයන් විශාල ප්‍රමාණයක් සිටින අතර, ඔවුන් රාජකාරි සඳහා වාර්තා කිරීම සම්බන්ධව කිසිදු දැනුවත් වීමක් පළාත් සභාවට නොමැති බව සාකච්ඡා කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින පළාත් සභාව මඟින් වැටුප් ලබන සියලු නිලධාරින්ගේ සේවයට වාර්තා කිරීම සම්බන්ධ වාර්තාවක් මාසිකව ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) අදාළ ආයතන ප්‍රධානීන් |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,<br>
ප්‍රධාන ලේකම්,<br>
බස්නාහිර පළාත.